# ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්

## පුරප්පාඩු

## කළමනාකරණ සහකාර - තාක්ෂණ ඛණ්ඩය 2 ( MA - 2- 1 -2016) (පිරිමි)

**අධ්‍යාපන සුදුසුකම් - (බාහිර අයදුම්කරුවන්)**

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදි , සිංහල/දෙමළ ,ඉංග්‍රිසි භාෂාව, ගණිතය ඇතුලුව විෂයන් 04කට සම්මාන සහිතව එක් වරකදි විෂයයන් හයකින් (06) සමත් වි තිබිම සහ ,

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදි , විද්‍යා විෂය ධාරාවෙන් සියලුම විෂයන්ගෙන් (සාමාන්‍ය පොදු පරික්ෂණය හැර) සමත්ව තෘතිය අධ්‍යාපන පාඨමාලාවක් හැදෑරිම සඳහා අවශ්‍ය සාධන මට්ටම ලබා තිබිම.

**තාක්ෂණික නිපුණතා /ප්‍රවිණතා**

තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නියම කර ඇති පරිදි ජාතික වෘත්තිය කුසලතා (N.V.Q) පහ (05) මට්ටමට අඩු නොවන්නා වු තාක්ෂණික පාඨමාලාවක් සාර්ථකව හදාරා සහතික ලබා තිබිම.

**තනතුරට විශේෂිත වෙනත් සුදුසුකම් :-**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාව විසින් පිළිගත් යාන්ත්‍රික ඉංජිනේරු ඩිප්ලෝමාවක් හෝ ඊට සමාන සුදුසුකම් සහ වසර 01 ක රජයේ පිළිගත් වානිජ ආයතනයක නිෂ්පාදන හෝ ඉංජිනේරු අංශයේ පළපුරුද්ද.

**ආරම්භක වැටුප් පරිමාණය :-**

2016.01.01.දින සිට MA2-1 -2016 - රු 30,310 /= මිට අමතරව රජයේ අනුමත දිමනාද ගෙවනු ලැබේ. (2025 අප්‍රේල් මස සිට නව අයවැය අනුව වැටුප් සංශෝධනය කරනු ඇත.)

**වයස**

වයස අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය.

**වෙනත් :-**සෑම අයදුම්කරුවෙකුම ,

I. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
II. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරිම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
III. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
IV. සේවකයා විසින් සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය 10%ක් දැරිය යුතු අතර සමාගම විසින් ඒ සඳහා 15%ක් දරනු ලැබේ. සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදලට 3%ක දායකත්වයක් ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම මගින් දරනු ලැබේ.
V. රාත්‍රි වැඩමුර ක්‍රියාත්මක වේ.

අයදුම්පත් තමා විසින් ම සකස් කොට සියළු තොරතුරු හා සුදුසුකම් ඇතුලත් කර කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුරේ නම පැහැදිලිව සඳහන් කර අදාල අයදුම්පත් 2025.03.17 වන දිනට පෙර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

**ලිපිනය:- ජ්‍යෙෂ්ඨ කළමනාකරු, (මානව සම්පත් හා නිති),**
**ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්**
**තැ.පෙ 17 ,කපුවත්ත,**
**ජා-ඇල.**

අඩ සියවසක මතකයේ රැඳි රස